KIDS GOD WORSHIP
www.kidworship.kr


103Page


104Page


105Page


106Page


107Page


108Page

# පේදුරු තුමා
## (පේදුරුතුමා විසින් කොර සිඟන්නා සුව කිරීම)

–Peter (Peter Heals the Crippled Beggar)–

දවසක් පේදුරු සහ යොහන් යාච්ඤා කරන වෙලාවේදී දේව මාළිගාවට ගියා. දේව මාළිගාවේ දොරටුව ළඟ කොර වූ මිනිසෙක් සිටිනවා ඔවුන් දැක්කා. එයා උපතින්ම කොර වූ කෙනෙක් නිසා ජීවිත කාලේම එයා ඇව්දලා නෑ.

---

හැමදාම දේව මාළිගාවට යන එන අයගෙන් ඔහු සිඟමන් ඉල්ලුවා. මේ ආකාරයෙන්ම ඔහු පේදුරු සහ යොහන්ද දේව මාළිගාවට යද්දී ඔවුන්ගෙනුත් සිඟමන් අයැද සිටියා.
“අනේ කරුණාකර මට උදව් කරන්න”

---

ඒත් පේදුරු සහ යොහන් ළඟ මුදල් නම් තිබුණේ නෑ.
“අපි දිහා බලන්න”
කොර වූ මේ හිඟන්නා පේදුර සහ යොහන් දෙස බැලුවා. එවිට පේදුරු කතාකරමින්:
“රන් රිදී මට නැත. එහෙත් මට ඇති දේ නුඹට දෙමි”
කොර වූ මේ සිඟන්නා තමුන්ගේ අත් ඔවුන් දෙසට දිගුකර බලා සිටිනවා, ඔවුන්ගෙන් යමක් ලැබේය, යන අපේක්ෂාවෙන්,

---

පේදුරු කොර මිනිසාට කතා කරමින්, “නාසරිය යේසුස්වහන්සේගේ නාමයෙන් නැඟිට ඇව්දින්න !” කියා ඔහුගේ දකුණතින් අල්ලා නැගිට්ටුවා.

---

එකණෙහිම, කොරාගේ ඇස්වට සවි වී, ඔහු පැන නැඟිට ඇව්දින්න පටන් ගත්තා.
ගොඩාක් සතුටුයි. ඔහු උඩපැන නටමින් ඇව්දින්න පටන්ගත්තා. මොනවද කරන්න ඕන කියලා ඔහුටම හිතාගන්නත් බැරි වුණා. ඔහු දෙවියන්වහන්සේට ප්‍රශංසා කරමින් පේදුරු සහ යොහන් පිටුපස්සේ දේව මාළිගාවට ගියා.

---

දෙවියන්වහන්සේට ප්‍රශංසා කරමින් ඇව්දින මේ මනුෂ්‍යාව දුටු අය, “මේ දේව මාළිගාව ළඟ සිඟමන් අයැදිමින් සිටි මිනිසා නේද” කියා හඳුනා ගත්තා.
“ආහ්... එයා අර ගේට්ටුව ළඟ සිඟමන් ඉල්ලුවේ මේ මිනිහා නේද? ”
“ඔහ්... මොනවද දන්නේ නෑ, එයාට වුණේ ? ”
හැම කෙනෙක්ම මේ ගැන පුදුම වී, රහසින් එකිනෙකාට කතාකරන්න පටන්ගත්තා. සිඟන්නා පේදුරු සහ යොහන් පිටුපස කෑගසමින් ම යන්නට වුණා.
“මේ මිනිස්සු මගේ කකුල් දෙක සුව කළා.”
එවිට පේදුර සහ යොහන්ව බලන්නට මිනිසුන් එක්රොක් වුණා. පේදුරු ජනතාවට කතා කරමින් :
“මනුෂ්‍යයනි, අපි මේ කොර මිනිසා සුව කළේ නෑ. අපිත් ඔබ වගේම මිනිසුන් පමණයි. දෙවියන්වහන්සේගේ පුත්‍ර වූ යේසුස්වහන්සේ තමයි මේ මිනිසාව සුවපත් කළේ.”
පේදුරු හැම කෙනෙක්ටම පසුතැවිලිව ඒ යේසුස්වහන්සේ කෙරේ අදහාගැනීම පිණිස දිරිමත් කළා.

යේසුස්වහන්සේගේ ගෝලයන්, සෙනගට මෙසේ දේශනා කිරීම සම්බන්ධව පූජකයන්, විනයධරයන්, වැඩිමහල්ලන් සහ ව්‍යවස්ථාව උගන්වන්නන් අප්‍රසාදය පළ කළා. මන්ද මෙසේ කිරීම බාධාවක් සේ ඔවුන් සිතුවා. යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටීම සම්බන්ධව කරන ඉගැන්වීමට ඔවුන් කැළඹුනා. ඔවුන් පේදුරු සහ යොහන්ව අල්ලා සිරගෙට දැම්මා.

..........................................................................................................................................


109Page

ඊට පසු දින පේදුරු සහ යොහන් සැන්හෙඩ්‍රින් මන්ත්‍රණ සභාවට රැගෙන ගියා. පූජකයන්, විනයධරයන්, වැඩිමහල්ලන් සහ ව්‍යවස්ථාව උගන්වන්නන් ඔවුන්ගෙන් ප්‍රශ්ණ කළා.
"ඔබලා මොන බලයකින්ද, කාගේ නාමයෙන්ද මේ දේවල් කරන්නේ ?"
පේදුරු " මම දේශනා කරන්නේ, යේසුස්වහන්සේ ගැන. උන්වහන්සේ තමයි මේ මිනිසාව සුවපත් කළේ "
පේදුරු ධෛර්යමත්ව නිර්භීතව කතා කළා...
"ඔබලා නැවත කවදාකවත් යේසුස්වහන්සේ ගැන කතා කරන්න එපා. ඔයා අපි කියන දේට කීකරු වුණේ නැත්නම් ඔයා ලොකු අමාරුවක වැටෙයි"
පූජකයන්, විනයධරයන්, වැඩිමහල්ලන් සහ ව්‍යවස්ථාව උගන්වන්නන් ඔවුන්ට අනතුරු ඇඟෙව්වා.
"ඒත් අපි දෙවියන්වහන්සේගේ වචනයට කීකරු වීමයි කරන්නේ ..."

..........................................................................................................................................


110Page

පේදුරු උගත් මිනිසෙක් නොවුනාට දෙවියන්වහන්සේගේ ප්‍රඥාවෙන්, තර්කානුකූලව. සාවධානව, නිශ්කලංකව ඔවුන් ඉදිරියේ කතා කළා. පූජකයන්, විනයධරයන්, වැඩිමහල්ලන් සහ ව්‍යවස්ථාව උගන්වන්නන් පුදුමයට පත් වුණා. ඒ නිසා පේදුරු සහ යොහන්ට කීමට තවත් දෙයක් ඔවුන්ට ඉතිරි වුණේ නෑ.

..........................................................................................................................................


111Page

කොර වූ සිඟන්නාගේ සුවය දුටු සියල්ලෝ ම දෙවියන්වහන්සේට ප්‍රශංසා කළා. ඊට පසුව පේදුරු ගිය සෑම තැනකම යේසුස්වහන්සේ ගැන දේශනා කළා.

ජීවිතයට අදාල කිරීම - දුවේ පුතේ, ඔයාලා අතරත් ඇති යේසුස්වහන්සේට බනින, අපහාස වචන කතා කරන අය. ඒ වගේ අයත් එක්ක රණ්ඩු වෙන්නත්, තර්ක කරන්නත් යන්න එපා. ඒත් භය වෙන්නත් එපා. අවස්ථාවක් ලැබුණාම, ඇත්ත මොකක්ද කියලා, ඔයා දන්න තරමට සාමකාමීව-හොඳින් ඒ අයට කියා දෙන්න.